# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

**මෙවර විභාගයේදී සෑම විභාග අපේක්ෂකයකුම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (online) ක්‍රමය මගිනි.** මාර්ගගත ආකාරයෙන් යොමු කරන අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම අනිවාර්ය බව කරුණාවෙන් සලකන්න. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් පද්ධතියට ප්‍රවේශ වීමෙන් (2.1 කෙරෙහි අවධානය යොමු කරන්න.) බාගත (download) කර ගැනීමේ පහසුකම සලසා ඇත.

උක්ත විභාගයට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2020 ජූලි මස 22 දින සිට 2020 අගෝස්තු 31 වන දින තෙක් භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත මාර්ගගත ආකාරයෙන් (online) සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය හා විෂයයන්** ඇතුළත් කිරීමේ දී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. සංශෝධන සඳහා පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**02. අයදුම්පත් :**

**ලබා දී ඇති උපදෙස් පරිදි මාර්ගගත (online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව PDF ගොනුව මුද්‍රිත පිටපතක් ලෙස ලබා ගන්න. මුද්‍රිත පිටපතේ ඔබගේ අත්සන හා ඔබ අයත් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගේ අත්සන සහිතව විභාග දෙපාර්තමේන්තුවට තැපැල් මගින් එවිය යුතු ය. එම පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.**

**පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගය ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වීම් සහතිකය ලබා ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙනුම ලබමින් පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කොට ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

2.1 **පද්ධතියට ප්‍රවේශ වීම හා අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණික උපදෙස්**

i) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ "www.doenets.lk" නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

ii) Online Applications අයිකනය (tile) තෝරන්න (click කරන්න).

iii) G.C.E. O/L 2020 - Application for Student Registration (Private) අයිකනය (tile) තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

iv) Menu හි ඇති "Technical Instruction" අයිකනය තේරීම (click) මගින් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණික උපදෙස් ලබා ගත හැක.

2.2 2020 අගෝස්තු මස 31 වැනි දිනෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. විභාග අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු සෙ.මී. 28 x සෙ.මී. 21 (A4) ප්‍රමාණයේ සුදු කඩදාසියක දෙපැත්තට සිටිනසේ අයදුම්පත මුද්‍රණය කරගත යුතුයි. **අයදුම්පත් 2020 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට පසුව තැපැල් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.3 **එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.**

U.U.A.6.3.2016.AL Paper AD

03. **විභාග ගාස්තු ගෙවීම ඃ**
විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් (online payment) මගින් සිදුකළ යුතුය.

3.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment method" යටතේ ඇති "pay by post" අයිකනය තෝරා ගත යුතුය. මුද්දර මගින් හෝ මුදල් ඇණවුම් මගින් මුදල් ගෙවීම සිදු කළ නොහැක. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

ලබාගත් කුවිතාන්සිය මුද්‍රණය කර ගත් අයදුම්පතේ අංක 14 යටතේ ඇලවිය යුතුයි. 2020 ජුලි 22 වැනි දින සිට 2020 අගෝස්තු 31 වන දින තෙක් දිවයිනේ සියලු ම තැපැල්/උප තැපැල් කාර්යාලවල මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදා ඇත.

3.2 බැංකු කාඩ්පත් (credit/debit cards) මඟින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/debit card" අයිතමය තෝරා ගත යුතුය.

3.3 විභාග ගාස්තු

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 6 - 9 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 100/- | 150/- | 200/- | 250/- | 300/- | 350/- |

04. එක් ලියුම් කවරයක් තුළ බහා එවිය හැක්කේ එක් අයදුම්පතක් පමණි. **අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020 - නගර අංකය ............ හා නගරය .............."** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටු වීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්න නගරයකට යොමු කිරීමට සිදුවේ.

05. ඔබ තෝරා ගන්නා විෂයයන් හා නගරය ඉතා වැදගත් වේ. **එබැවින් අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමට පෙර විශේෂ අවධානයකින් එය නැවත වරක් කියවා එහි ඇතුළත් වී ඇති විෂයයන්, නගරය සහ අනෙකුත් තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බැලිය යුතු අතර, තවත් අයකු ලවා පරීක්ෂා කර තහවුරු කර ගැනීම ද ඉතා වැදගත් වේ.**

06. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රය සම්බන්ධ ව කිසියම් විමසීමක් කරන්නේ නම්, ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහා ම එම ප්‍රවේශ පත්‍රය ද රැගෙන විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත පැමිණිය යුතු ය.

07. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක්ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය ලිවිය යුතු අතර අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය ඇතුළත් නොකළ යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ද ඇතුළත් කළ යුතු ය.**

08. **අනන්‍යතාව ඔප්පු කිරීම**
විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සිය හඳුනාගැනීමේ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවකු වේ නම්, ඒ සඳහා නොපමාව ග්‍රාම නිලධාරී මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත අයදුම්පතක් ඉදිරිපත් කර තම ජාතික හැඳුනුම් පත සකස් කර ගත යුතු ය.

U.U.A.6.3.2016.AL Paper AD

09. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම් "candidates with special needs" යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.
**දෘශ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති** අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතේ වම් පස උඩ කෙළවරෙහි රතු පාටින් **"දෘශ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි."** යනුවෙන් සඳහන් කරන්න.

10. **විශේෂයෙන් සැලකිය යුතුයි ඃ**

10.1 මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

10.2 **විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය හෝ අයදුම් කරන ලද මාධ්‍යය හෝ අයදුම් කරන ලද විෂයයන් හෝ වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.**

10.3 අයදුම්පත් කැඳවීම අවසන් කරන දිනට පසුව තැපැල් කාර්යාලවලට මුදල් ගෙවා ඇති අයදුම්පත්‍ර සහ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4 දෙවන විෂය කාණ්ඩයට අයත් පහත සඳහන් විෂයයන් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නම් කරනු ලබන පාසලක ලියාපදිංචි වී ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුවේ. මෙම අවශ්‍යතාවය පූර්ණය නොකරන අයදුම්කරුවන්ට ලිඛිත විභාගයට පෙනී සිටිය ද ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.

(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භරත)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

දුරකථන අංක ඃ 011-2784208 / 011-2784537

ෆැක්ස් අංක ඃ 011-2784422

යොමු අංකය ඃ 6/4/OL/2020
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2020.07.22

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

U.U.A.6.3.2016.AL Paper AD

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට උපදෙස්

01. **පද්ධතියට ප්‍රවේශ වීම/පෞද්ගලික තොරතුරු ඇතුළත් කිරීම**

1.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

1.2 Online Applications අයිකනය (tile) තෝරන්න (click කරන්න).

1.3 "G.C.E. (O/L) Examinations - 2020 Application for Student Registration (Private)" අයිකනය (tile) තෝරන්න.

1.4 **Availability of the National Identity Card**

ඔබට ජාතික හැඳුනුම්පත තිබේ නම් "yes" තෝරන්න.

a. ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
b. title තොරන්න.
c. සම්පූර්ණ නම ඇතුළත් කරන්න.

ඔබට ජාතික හැඳුනුම්පත නොමැති නම් "No" තෝරා අනන්‍යතා අංකයක් ලබා ගත යුතුයි.

a. සම්පූර්ණ නම ඇතුළත් කරන්න.
b. උප්පැන්න සහතිකයේ අංකය ඇතුළත් කරන්න
c. ජංගම දුරකතන අංකය ඇතුළත් කරන්න.

ඉහත a, b සහ c අයිතම ඇතුළත් කර තහවුරු කිරීමෙන් පසු ඔබ ඇතුළත් කළ ජංගම දුරකථන අංකයට අනන්‍යතා අංකයක් ලැබෙනු ඇත.

> **උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ඇතුළත් කරන්න. මුලකුරු සමග නම ඇතුළත් නොකරන්න.**
> **උදාහරණ : KULASOORIYAGE MAHESH SUJITH DE SILVA**
> **පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි (අකුරු 90කට වඩා වැඩි) නමක් ඇත්නම් අයදුම්පතේ මුද්‍රිත පිටපතේ ඉහළින් සම්පූර්ණ නම සටහන් කරන්න.**

1.5 Date of Birth

උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ඇතුළත් කිරීම හෝ තේරීම සිදු කරන්න.

1.6 Gender

ස්ත්‍රී/පුරුෂ භාවය දැක්වීම සඳහා පුරුෂ නම් "Male" යන්න ද ස්ත්‍රී නම් "Female" යන්න ද තෝරන්න.

1.7 පෞද්ගලික දුරකථන අංකය (ජංගම) ඃ
පෞද්ගලික දුරකථන අංකය (ස්ථාවර) ඃ
විද්‍යුත් තැපැල් ලිපිනය ඃ:

1.8 Private Address

ලිපිනය ඃ ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න. " , ' - . ; _ " වැනි සලකුණු භාවිතා නොකරන්න.

a. Home Address : පෞද්ගලික ලිපිනය ඇතුළත් කරන්න. (තැපැල් නගරය ඇතුළත් කිරීමෙන් වළකින්න.)
b. Postal Town : තැපැල් නගරය ඇතුළත් කරන්න.

> **කිසි විටෙකත් තාවකාලික පදිංචි ස්ථානයේ ලිපිනය හෝ පෞද්ගලික/ජාත්‍යන්තර පාසලේ ලිපිනය ඇතුළත් නොකළ යුතුය.**

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

02. **Details of the Examination**

2.1 District and Town you wish to appear for the examination

තෝරාගත් දිස්ත්‍රික්කය සහ නගරය ඃ

ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් දිස්ත්‍රික්කය සහ නගරය තෝරාගන්න. **වැරදි නගරයක් ඔබ විසින් තේරීමෙන් ඉතා දුර විභාග මධ්‍යස්ථානයක් ලැබීමට ඉඩ ඇත**. ඔබ ඉල්ලා ඇති විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමක් සිදු කරනු නොලැබේ.

2.2 Medium of Examination

පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ

a. පෙනී සිටින භාෂා මාධ්‍යය තෝරන්න.
b. මාධ්‍ය දෙකකින් පෙනී සිටින්නේ නම් Bilingual (ද්විමාධ්‍ය) තෝරන්න. ඉංග්‍රීසි මාධ්‍යට අමතරව තමා පෙනී සිටින මාධ්‍ය මෙහිදී තේරිය යුතුය. ඒ අනුව සිංහල / ඉංග්‍රීසි (Sinhala / English) හෝ දෙමළ / ඉංග්‍රීසි (Tamil / English) තේරිය යුතුයි. **සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් එකවර විභාගයට පෙනී සිටිය නොහැක.**

U.U.A.6.3.2016.AL Paper AD

2.3 ඔබ පෙනී සිටීමට අවශ්‍ය විෂයයන් තෝරා ගන්න. ඃ
ඔබ ද්විමාධ්‍ය අයදුම්කරුවෙක් නම් පමණක් ඒ ඒ විෂයයන් ඉදිරියෙන් ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන මාධ්‍ය තේරිය යුතුයි.

2.4 ඔබ විසින් විෂයයන් තෝරා අවසන් වූ පසු ඔබ පෙනී සිටින විෂයන් ගණන හා ගෙවිය යුතු මුදල දිස් වේ. එය නිවැරදි නම් පමණක්,

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

03. **Payment Methods**
විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (online payment) සිදුකළ යුතුය.

3.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment method" යටතේ ඇති "pay by post" අයිතමය තේරිය යුතුය. මුද්දර මගින් හෝ මුදල් ඇණවුම් මගින් විභාග ගාස්තු ගෙවිය නොහැක. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

ලබාගත් කුවිතාන්සිය මුද්‍රණය කර ගත් අයදුම්පතේ අංක 14 යටතේ ඇලවිය යුතුයි. 2020 ජූලි 22 වැනි දින සිට 2020 අගෝස්තු 31 වන දින තෙක් දිවයිනේ සියලු ම තැපැල්/උප තැපැල් කාර්යාලවල මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදා ඇත.

3.2 බැංකු කාඩ්පත් (credit/debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/debit card" අයිතමය තෝරා ගත යුතුය.

3.3 විභාග ගාස්තු

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 6 - 9 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 100/- | 150/- | 200/- | 250/- | 300/- | 350/- |

ඉහත සඳහන් අවසාන දිනට පෙර විභාග ගාස්තු ගෙවා තිබුණ ද අවසන් දිනයෙන් පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව වැඩිදුරටත් දන්වමි.

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

04. **Applicants with special needs (Vision/Hearing/Other )**
විශේෂ අවශ්‍යතා

4.1 විශේෂ අවශ්‍යතා රහිත නම් "**No**" යන්න තෝරන්න.

4.2 ඔබ යම්කිසි විශේෂ අවශ්‍යතාවන් සහිත අයදුම්කරුවකු නම් "**Yes**" යන්න තෝරන්න. ඉන්පසු ලැබෙන පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

- Disability type - ආබාධයේ ස්වභාවය
  - Braille - බ්‍රේල් අයදුම්කරුවෙකි.
  - Hearing - ශ්‍රව්‍යාබාධිත අයදුම්කරුවෙකි.
  - Vision - දෘෂ්‍යාබාධිත අයදුම්කරුවෙකි.
  - Body functions/structure - කායික ආබාධ සහිත අයදුම්කරුවෙකි.
  - Other- වෙනත් ආබාධ සහිත අයදුම්කරුවෙකි.
- More details about the disability - ආබාධිත තත්ත්වය පිළිබඳ වෙනත් තොරතුරු
- If special center required, select it - විශේෂ මධ්‍යස්ථානයක් අයදුම්කරන්නේ නම්, එය තෝරන්න.

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

05. Application Summary

**ඔබ විසින් සම්පූර්ණ කළ තොරතුරුවල සාරාංශය දිස්වේ. ඔබ සම්පූර්ණ කර නොමැති තොරතුරු රතු පැහැයෙන් දිස්වේ. එවැනි සම්පූර්ණ නොවූ තොරතුරු ඇත්නම් "Back" මගින් ආපසු ගොස් අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.**

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

U.U.A.6.3.2016.AL Paper AD

06. **Declaration of the applicant**

අයදුම්කරුගේ ප්‍රකාශය පිළිගැනීම සඳහා "I agree" මත Click කරන්න. අයදුම්පත මුද්‍රණය කර ගැනීම සඳහා "submit" අයිකනය භාවිත කරන්න.

**07. ඇතුළත් කළ දත්ත සංශෝධනය කිරීම (Edit)**

7.1 ඔබ යම් වෙනස් කිරීමක් කරන්නේ නම් අයදුම්පත්‍රය "submit" කිරීමට පෙර කළ යුතුය.

7.2 අයදුම්පත "submit" කළ පසු පැය 72 තුළදී ජාතික හැඳුනුම්පත් අංකය හෝ ලබා දී ඇති අනන්‍යතා අංකය භාවිතා කර සිදු කළ යුතු සංශෝධනයන් සිදු කරන්න.

7.3 ජාතික හැඳුනුම්පත් අංකයක් නොමැති විට දත්ත සංශෝධනය සඳහා පළමුව ලැබෙන "National Identity Card Availability" කවුළුවේ "No" අයිතමය තෝරා දෙවනුව ලැබෙන "Unique Cord Retrival" කවුළුවේ "Close" අයිතමය තෝරන්න. ඔබ වෙත ලබා දී ඇති කෙටි පණිවිඩයෙහි (SMS) සඳහන් අංකය, ලැබෙන අයදුම්පතෙහි "Registration Cord" යටතේ ඇතුළත් කරන්න. අවශ්‍ය සංශෝධන සිදු කර නැවත අයදුම්පත බාගත (download) කර මුද්‍රණය කර ගන්න.

7.4 සංශෝධිත මුද්‍රිත පිටපත පමණක් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

08. **අයදුම්කරුගේ සහතිකය**

සුපරීක්ෂාකාරීව කියවා බලා මෙහි අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය.

අයදුම්පත්‍රය මුද්‍රණය කළ පසු අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහල/දෙමළ මාධ්‍යයෙන් උප්පැන්න සහතිකයේ පරිදි අයදුම්කරු විසින්ම ලිවිය යුතුය.

උදාහරණ **: කුලසූරියගේ මහේෂ් සුජිත් ද සිල්වා**

09. **හඳුනාගැනීමේ සහතිකය**

පෞද්ගලික අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රයේ අත්සන සහතික කළ යුත්තේ, තමා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් පමණි. ඒ සඳහා ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හෝ වලංගු රියදුරු බලපත්‍රයේ හෝ ඡායා පිටපතක් රැගෙන යා යුතු ය.

10. **අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම**

10. 1 පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙනගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටින අපේක්ෂකයින් විභාග තහනමකට ලක් කෙරෙනු ඇත.

10.2. නියමිත දිනට පසුව මුදල් ගෙවනු ලබන හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.3. පෞද්ගලික / ජාත්‍යන්තර පාසල්වල ලිපිනයන්, පෞද්ගලික ලිපිනය ලෙස සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4. මුද්‍රිත පිටපත විභාග දෙපාර්තමේන්තුවට යොමු නොකරන ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

U.U.A.6.3.2016.AL Paper AD

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - විෂය ලේඛනය
## க.பொ.த.(சா.தர)ப் பரீட்சை - பாடப்பட்டியல்
## G.C.E.(O/L) Examinations - List of Subjects

➢ ආගම්/சமயம்/ Religion

11 බුද්ධ ධර්මය/பௌத்தம்/ Buddhism
12 ශෛවනෙරි/சைவ நெறி / Saivanery
14 කතෝලික ධර්මය/கத்தோலிக்க திருமறை/ Catholicism
15 ක්‍රිස්තියානි ධර්මය/கிறிஸ்தவம்/ Christianity
16 ඉස්ලාම්/இஸ்லாம் / Islam

➢ භාෂාව හා සාහිත්‍යය/மொழியும் இலக்கியமும்/ Language & Literature

21 සිංහල භාෂාව හා සාහිත්‍යය/சிங்கள மொழியும் இலக்கியமும் / Sinhala Language & Literature
22 දෙමළ භාෂාව හා සාහිත්‍යය/தமிழ் மொழியும் இலக்கியமும்/ Tamil Language & Literature

31 ඉංග්‍රීසි භාෂාව/ஆங்கில மொழி/ English Language
32 ගණිතය/கணிதம்/ Mathematics
33 ඉතිහාසය/வரலாறு/History
34 විද්‍යාව/விஞ்ஞானம்/ Science

➢ පළමු විෂය කාණ්ඩය/முதலாம் பாடத்தொகுதி / Category I

60 ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය/வணிகமும் கணக்கீட்டுக் கல்வியும் / Business & Accounting Studies
61 භූගෝල විද්‍යාව/புவியியல்/ Geography
62 පුරවැසි අධ්‍යාපනය /குடியியற் கல்வி / Civic Education
63 ව්‍යවසායකත්ව අධ්‍යයනය/முயற்சியாண்மைக் கற்கை/ Entrepreneurship Studies
64 දෙවන භාෂාව (සිංහල)/இரண்டாம் மொழி (சிங்களம்)/ Second Language (Sinhala)
65 දෙවන භාෂාව (දෙමළ)/இரண்டாம் மொழி (தமிழ்)/ Second Language (Tamil)
66 පාලි/பாளி/ Pali
67 සංස්කෘත/சமஸ்கிருதம்/ Sanskrit
68 ප්‍රංශ/பிரெஞ்சு/ French
69 ජර්මන්/ஜேர்மன்/ German
70 හින්දි/ஹிந்தி/ Hindi
71 ජපන්/ஜப்பான்/ Japanese
72 අරාබි/அரபு/ Arabic
73 කොරියන්/கொரியன்/ Korean
74 චීන/சீன மொழி/ Chinese
75 රුසියන්/ரஷியன் / Russian

➢ දෙවන විෂය කාණ්ඩය/இரண்டாம் பாடத்தொகுதி / Category II

40 සංගීතය (පෙරදිග)/ சங்கீதம் (கீழைத்தேயம்) / Music (Oriental)
41 සංගීතය (අපරදිග)/சங்கீதம் (மேலைத்தேயம்)/ Music (Western)
42 සංගීතය (කර්ණාටක)/சங்கீதம் (கர்நாடகம்) /Music (Carnatic)
43 චිත්‍ර/சித்திரம் / Art
44 නැටුම් (දේශීය)/நாட்டியம் (தேசிய) / Dancing (Oriental)
45 නැටුම් (භරත)/நாட்டியம் (பரதம்) / Dancing (Bharata)
46 ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் ஆங்கிலம்/ Appreciation of English Literary Texts
47 සිංහල සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் சிங்களம்/ Appreciation of Sinhala Literary Texts
48 දෙමළ සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் தமிழ்/ Appreciation of Tamil Literary Texts
49 අරාබි සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் அரபு/Appreciation of Arabic Literary Texts
50 නාට්‍ය හා රංග කලාව (සිංහල)/நாடகமும் அரங்கியலும் (சிங்களம்)/ Drama and Theatre (Sinhala)
51 නාට්‍ය හා රංග කලාව (දෙමළ)/நாடகமும் அரங்கியலும் (தமிழ்)/ Drama and Theatre (Tamil)
52 නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)/ நாடகமும் அரங்கியலும் (ஆங்கிலம்)/ Drama and Theatre (English)

➢ තෙවන විෂය කාණ්ඩය/மூன்றாம் பாடத்தொகுதி / Category III

80 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/தகவல் தொடர்பாடலும் தொழினுட்பவியலும்/ Information & Communication Technology
81 කෘෂි හා ආහාර තාක්ෂණය/ விவசாயமும் உணவுத் தொழினுட்பவியலும்/Agriculture & Food Technology
82 ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය/நீரூயிரினவளத் தொழினுட்பவியல்/ Aquatic Bioresources Technology
84 ශිල්ප කලා/நுண்கலை/ Art & Crafts
85 ගෘහ ආර්ථික විද්‍යාව/மனைப்பொருளியல்/ Home Economics
86 සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය/சுகாதாரமும் உடற்கல்வியும் / Health & Physical Education
87 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය/தொடர்பாடலும் ஊடகக் கற்கையும் / Communication & Media Studies
88 නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය/வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும்/ Design & Construction Technology
89 නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය/வடிவமைப்பும் இயந்திரத் தொழினுட்பவியலும்/ Design & Mechanical Technology
90 නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය/வடிவமைப்பும் மின் இலத்திரனியல் தொழினுட்பவியலும் / Design, Electrical & Electronic Technology
92 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (சிங்களம்)/ Electronic Writing & Shorthand (Sinhala)
93 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (දෙමළ)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (தமிழ்)/ Electronic Writing & Shorthand (Tamil)
94 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (ඉංග්‍රීසි)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (ஆங்கிலம்)/ Electronic Writing & Shorthand (English)

H.6.4.Su list. indd